

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2024

ශීර්ෂ අංක 19

Head No

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය

பாராளுமன்றத்தின் எதிர்க்கட்சித் தலைவர் அலுவலகம்

Office of the Leader of the Opposition of Parliament

3rd Floor,
Parliament of Sri Lanka
Sri Jayewardenepura Kotte,
Sri Lanka.

No.30
Sir Marcuss Fernnado Rd,
Colombo 07
Sri Lanka

පටුන

1.1 හැඳින්වීම 1

1.2 ප්‍රධාන කාර්යයන් 1

1.2.1 පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂ නායක තුමා වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන් 2

1.2.2 විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය සංවිධායකවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන් 2

1.2.3 විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන් 2

1.3 විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රධාන අංශ 3

1.3.1. පාර්ලිමේන්තු කටයුතු අංශයේ කාර්යයන් 3

1.3.2. ආයතන අංශයේ කාර්යයන් 3

1.3.3. පරිපාලන අංශයේ කාර්යයන් 4

1.3.4. ගිණුම් අංශයේ කාර්යයන් 4

1.4. විපක්ෂ නායක කාර්යාලයේ සංයුතිය 4

1.5 ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයේදී විපක්ෂයේ කාර්යභාරය 6

1.6 ආයතනික සටහන 7

02 පරිච්ඡේදය 8

ප්‍රගතිය 8

2.1. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න 8

2.2 කාලීන වැදගත් සිදුවීම් පිළිබඳ තොරතුරු 8

2.3 සභාව කල් තබන අවස්ථාවේ දී ප්‍රශ්න 8

2.4 අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්න 8

2.5 වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 8

2.6 සභාව කල් තබන අවස්ථාවේ දී විවාදයට ගෙන එනු ලබන යෝජනා 8

2.7 පනත් කෙටුම්පත්, නීති හා රෙගුලාසි සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදු කිරීම 10

2.8 විශ්වාසභංග යෝජනා 16

2.9 විදේශ දූත පිරිස් හා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සමග හමුවීම 16

2.10 මහජන ගැටලු පිළිබඳ කටයුතු කිරීම 16

2.11 පාර්ලිමේන්තු විවාද සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය 16

2.12 අතුරුසම්මත ගිණුම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු 17

2.13 පාර්ලිමේන්තුවේ කමිටු පවත්වාගෙන යාම සඳහා දායකත්වය 17

2.14 ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම 18

2.15 නිල මැදිරි රාජකාරි 18

2.16 පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පත් කිරීමට විපක්ෂය විසින් කරන ලද යෝජනා 18

2.17 මන්ත්‍රීවරුන් වෙනුවෙන් සපයන ලද වෙනත් සේවාවන් 18

2.18 ආයතන අංශයෙහි කාර්යයන්හි ප්‍රගතිය 18

2.18.1 විපක්ෂ නායක කාර්යාලයේ රජයේ නිලධාරීන් සඳහා සිදුකළ කටයුතු 19

2.18.2 පෞද්ගලික හා තාවකාලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් සිදුකළ කටයුතු 19

2.19 පරිපාලන අංශයේ කාර්යයන්හි ප්‍රගතිය 19
2.19.1 විපක්ෂ නායක කාර්යාලයේ මාධ්‍ය අංශයක් ස්ථාපිත කිරීම.....19
2.20 ගිණුම් අංශයේ කාර්යයන්හි ප්‍රගතිය 20
03 පරිච්ඡේදය 21
2024 මහා මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නියෝජනය.....21
3.1. විපක්ෂයේ ප්‍රධාන පක්ෂ හා ලබා ගත් ආසන සංඛ්‍යාව 21
3.5 විපක්ෂය නියෝජනය පක්ෂ හා මන්ත්‍රීවරුන් 22
04 පරිච්ඡේදය 24
4.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය 29
4.3 වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව/දිසා ලේකම් කාර්යාලය/ පළාත් සභාව වෙත වියදම් සඳහා මු.රෙ. 208 ලබාදුන් මුදල.....29
4.4 මූල්‍යමය නොවන වත්කම් වාර්තාකරණ කාර්ය සාධනය ප්‍රතිපාදන.....29
05 පරිච්ඡේදය 30
කාර්ය සාධන දර්ශක.....30
06 පරිච්ඡේදය 31
තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ කාර්ය සාධනය.....31
6.1 ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයේදී විපක්ෂයේ කාර්යභාරය 31
6.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා විපක්ෂනායක කාර්යාලයේ මැදිහත්වීම 32
6.2.1. පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණය සහ වගවීම 32
6.2.2. විකල්ප ප්‍රතිපත්ති සංවර්ධනය.....32
6.2.3. සියලු පාර්ශ්ව නියෝජනය ශක්තිමත් කිරීම 32
6.3. උපායමාර්ගික ප්‍රවේශයන්.....32
6.3.1. සර්වපාක්ෂික සහයෝගිතාව.....32
6.3.2. ජාත්‍යන්තර හවුල්කාරිත්වය සහ උපදේශනය.....32
6.3.3. අධීක්ෂණ සහ ඇගයීමේ විශිෂ්ටත්වය.....32
6.3.4. දේශගුණික නායකත්වය සහ පරිසර ක්‍රියාමාර්ග 33
6.4. තිරසර අනාගතයක් ගොඩනැගීම 33
07 පරිච්ඡේදය 34
මානව සම්පත් පැතිකඩ.....34
7.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.....34
08 පරිච්ඡේදය 35

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ පාර්ලිමේන්තුවේ කාර්යභාර්ය අංශ හතරකින් සිදු වේ. **නියෝජනය, නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ අධීක්ෂණය** එම කරුණු හතරයි. මෙම ක්‍රියාවලිය ඉටු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන, ස්ථාවර නියෝග, කථානායකවරයාගේ තීන්දු සහ සාම්ප්‍රදායිකව භාවිත කරනු ලබන පරිචයන් උපයෝගි කර ගනු ලැබේ. එම සිව්වැදෑරුම් අරමුණු ක්‍රියාවට නැංවීමට මූලික නීතිය හා පාර්ලිමේන්තුව මගින් සම්මත කොට ඇති වෙනත් නීති රීති තුළින් පාර්ලිමේන්තුවට පැවරී ඇති වගකීම්, වගවීම් පාර්ලිමේන්තුව තුළ ශක්තිමත් කිරීම පවත්වාගෙන යාමේ ප්‍රධාන කාර්යභාර්ය පැවරී ඇත්තේ විපක්ෂයටයි.

වාර්ෂික අයවැය ලේඛනය පිළිබඳ වූ විවාදය සංවිධානය කිරීම පවත්වාගෙන යාම පිළිබඳ වූ වගකීම පමණක් විමසා බැලුව ද එය තහවුරු වේ. වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදාය අපට හඳුන්වා දුන් මහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විපක්ෂය හඳුන්වනු ලබන්නේ රැජිනගේ හෝ රජුගේ විපක්ෂය ලෙසයි. මෙම අර්ථ ගැන්වීම තුළ ද පැහැදිලි වන්නේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ විපක්ෂයේ ඇති වගකීමයි.

පසුගිය කාල සීමාව තුළ විපක්ෂනායක කාර්යාලය පාර්ලිමේන්තුව තුළ සිය කාර්ය භාර්ය ඉටු කළේ මෙම මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා වූ වගවීමකින් යුතුවයි. සමාලෝචිත වසර තුළ විපක්ෂ නායක කාර්යාලය ඉටු කළ කාර්ය භාර්ය විචාරශීලීව විමසා බැලීමටත්, එය හඳුනා ගැනීමටත් මෙම වාර්තාව මඟපෙන්වීමක් වන බව අපගේ විශ්වාසයයි.

දැක්ම



"ආණ්ඩුව සුපරීක්ෂාවට යටත්කොට තැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම"

මෙහෙවර



"ආණ්ඩුවේ ප්‍රතිපත්ති විවේචනාත්මක විග්‍රහයකට ලක් කරමින් ආණ්ඩුව ප්‍රශ්න කරමින් එහි වගවීම සහතික කිරීම, විකල්ප යෝජනා කිරීම හා විකල්ප ආණ්ඩුකරණයක් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ විපක්ෂය වෙත අවශ්‍ය පහසුකම් සම්පාදනය"

අරමුණු



- ❖ පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන් සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙත කාර්යක්ෂම හා ඵලදායී සේවයක් සපයා දීම.
- ❖ පාර්ලිමේන්තු කාර්යයන් ඉටු කිරීමෙහිලා කාර්යක්ෂම සම්බන්ධීකරණ ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීම.
- ❖ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙත විසින් රාජ්‍ය යාන්ත්‍රණය තුළින් මගහැරෙන මහජන ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම හා විකල්ප රාජ්‍ය ප්‍රතිපත්ති හඳුනා ගැනීම හා සම්පාදනය.

1.2 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුව සුපරීක්ෂාවට යටත් කොට තබා ගනිමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සිය කාර්යයන් විශිෂ්ට අයුරින් ඉටු කිරීමට හැකිවනු පිණිස විපක්ෂයට එහි කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රධාන කාර්යයයි. මීට අමතරව මහජන ගැටලු පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ විසඳා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම්කරණය සිදු කරනු ලබන අතර ඒ අනුව, විපක්ෂ නායක කාර්යාලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

1.2.1 පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂ නායක තුමා වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්

- කාලීන වැදගත් සිදුවීම් හා මහජන ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සාරාංශ/කෙටි සටහන් සකස් කිරීම.
- පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිත අයිතමයනට අදාළ න්‍යාය පත්‍රය හා සම්බන්ධ පනත් කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි කෙටුම්පත් පිළිබඳව සංක්ෂිප්ත වාර්තා ලබා දීම සහ පනත් කෙටුම්පත් සංශෝධන ඉදිරිපත් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා හමුවීමට අපේක්ෂා කරන විදේශ දූත කණ්ඩායම් රාජ්‍ය තාන්ත්‍රිකයන්, විදේශීය සම්භාවනීය අමුත්තන් සහ සෙසු ප්‍රභූන් සමඟ සාකච්ඡා සඳහා එම රැස්වීම් සංවිධානය අවශ්‍ය සංධාන (Protocol) හා සම්පාදන සහාය ලබා දීම.
- කාලීන වැදගත් සිදුවීම් සම්බන්ධ විමර්ශන කටයුතු සිදුකර වාර්තා ලබාදීම.
- විවිධ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ගරු විපක්ෂ නායකතුමා හමුවීමට පැමිණෙන කණ්ඩායම් සඳහා රැස්වීම් සම්බන්ධීකරණය.
- විවිධ ජාත්‍යන්තර සංවිධාන, පර්යේෂණ ආයතන විසින් නිකුත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ඇගයීම් කර සටහන් සකස් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා වෙත ලැබෙන මහජන ගැටලු, පැමිණිලි හා දුක්ගැනවිලි සම්බන්ධව සුහදායී ප්‍රතිචාරයක් ලබාගනු පිණිස අදාළ ආයතනයන් වෙත ඉදිරිපත් කිරීම හා ඒවා සම්බන්ධ පසු විපරම් සිදුකිරීම.

1.2.2 විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය සංවිධායකවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්

- විපක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු විවාදවලට සහභාගිවන ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුළත් කර ඒ සඳහා අවශ්‍ය කාල වේලාවන් වෙන් කර කටීක ලැයිස්තුව සකස් කිරීම.
- විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පැවැත්වීම සඳහා අදාළ කටයුතු සම්පාදනය කිරීම.
- පාර්ලිමේන්තුවේ පැවැත්වෙන ඡන්ද විමසීම් සඳහා පහසුකම්කරණය.
- විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ කණ්ඩායම් සමඟ පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු කමිටු සඳහා මන්ත්‍රීවරුන් නම් කිරීම හා එම ලැයිස්තුව පාර්ලිමේන්තු මහ ලේකම් වෙත ඉදිරිපත් කිරීම හා එම කමිටු තුළ කාර්යයන් අධීක්ෂණය කිරීම.
- පාර්ලිමේන්තුවේ පක්ෂනායක රැස්වීම් සඳහා සහභාගිවීමට සහායවීම.
- පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අධීක්ෂණය කිරීම හා විපක්ෂයේ කාර්යය භාරය නිවැරදිව සිදුවන බවට සහතික වීම.

1.2.3 විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්

- පාර්ලිමේන්තු රැස්වීම් සතිවල න්‍යාය පත්‍රය අනුව පනත් කෙටුම්පත් සහ රෙගුලාසි සම්බන්ධ පර්යේෂණ හා සංක්ෂිප්ත සටහන් ලබාදීම.
- අයවැය විවාද හා කාරක සභා විවාද සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කර දීම.
- සභාව කල්තැබීමේ විවාද සඳහා අවශ්‍ය පසුබිම් තොරතුරු සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම.
- සභාව කල්තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න සැකසීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ ඒවා පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත භාරදීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු විවාද සඳහා සූදානම් වීමට විවාදයට අදාළ විෂයය පිළිබඳ විශේෂඥයන් හා වෘත්තීය සමිති නියෝජිතයින් විසින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය අදහස් ගරු මන්ත්‍රීවරුන් වෙත සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය රැස්වීම් සංවිධානය.
- පාර්ලිමේන්තුවේ විවිධ කමිටු සඳහා සහ අනෙකුත් පාර්ලිමේන්තු කටයුතු සඳහා ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ උපරිම ඵලදායිතාවකින් යුතුව ඔවුන්ට දායකත්වය සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්කරණය.
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන යෝජිත දින, කාලවේලාවන් සහ පාර්ලිමේන්තු වැඩසටහන භාෂාත්‍රයෙන් සකස් කොට එය විපක්ෂයේ සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත සන්නිවේදනය කිරීම.
- පක්ෂ කණ්ඩායම් රැස්වීමේ දී පාර්ලිමේන්තු සතියේ විවාදයට ගනු ලබන කරුණු සම්බන්ධව දැනුම්වත් කිරීම.

1.3 විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රධාන අංශ

පාර්ලිමේන්තුවේ විපක්ෂනායක කාර්යාලය පාර්ලිමේන්තු කටයුතු අංශය, ආයතන අංශය, පරිපාලන අංශය සහ ගිණුම් අංශය යන ප්‍රධාන අංශ හතරක් ඔස්සේ ක්‍රියාත්මක වේ. එහි දී පාර්ලිමේන්තු කටයුතු අංශය යටතේ පර්යේෂණ අංශයක් ස්ථාපනය කොට ඇත.

1.3.1. පාර්ලිමේන්තු කටයුතු අංශයේ කාර්යයන්

- පාර්ලිමේන්තු රැස්වීම් සතිවලට අදාළ පාර්ලිමේන්තු වැඩසටහන් සහ වෙනත් තීරණ පිළිබඳ දැනුවත් වී ඒවා පිළිබඳ වාර්තා පවත්වාගෙන යාමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම්වලට විපක්ෂ නායක කාර්යාලය නියෝජනය කරමින් සහභාගි වීම.
- ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා විපක්ෂයේ පක්ෂ සම්බන්ධීකරණය, ගරු මන්ත්‍රීවරුන්ගේ නම් පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- පාර්ලිමේන්තුවේ කාරක සභා සඳහා විපක්ෂයේ නියෝජනයන් නම් කර පාර්ලිමේන්තු මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ පක්ෂ නායකයන් විසින් ස්ථාවර නියෝග අංක 27(2) යටතේ ඉස්මතු කරනු ලබන හදිසි පොදු වැදගත්කමකින් යුත් කරුණුවලට අදාළ ප්‍රශ්න පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- සභාව කල්තබන අවස්ථාවේ යෝජනා සහ ප්‍රශ්න සඳහා වෙන්කර ඇති දින පිළිබඳව විපක්ෂයේ පක්ෂ දැනුවත් කොට, එම සභාව කල්තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න ලබාගැනීම සහ ඒවා පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත භාරදීම.
- ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ලබාදෙන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- විසර්ජන පනත් කෙටුම්පත තුන්වන වර කියවීම සඳහා වාර්ෂික අයවැය වැඩසටහනේ කාරක සභා අවස්ථා වැඩසටහන භාෂාත්‍රයෙන් සකස් කොට, එය මුද්‍රණය කරවා, අදාළ රජයේ ආයතන වෙත එහි මුද්‍රිත පිටපත් බෙදාදීම.
- සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියකම පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිත අයිතමයනට අදාළ න්‍යාය පත්‍රය හා සම්බන්ධ පනත් කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි කෙටුම්පත්, පනත් කෙටුම්පත් සංශෝධන ආදිය ඇතුළත් සටහන් පත් සකස් කොට, නිසි අවධානය පිණිස ඒවා විපක්ෂයේ පක්ෂ නායකයන් වෙත ලබාදීම.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙත අවශ්‍ය සහාය ලබාදෙනු පිණිස සියලු පාර්ලිමේන්තු රැස්වීම් දිනයන්හි දී විපක්ෂ නායක ලේකම් සඳහා වෙන්කර ඇති නිල මැදිරියෙහි නිලධාරීන් රාජකාරියෙහි යෙදවීම.
- විපක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු විවාදවලට සහභාගිවන ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුළත් කර ඒ සඳහා අවශ්‍ය කාල වේලාවන් වෙන් කර කටීක ලැයිස්තුව සකස් කිරීම.

1.3.2. ආයතන අංශයේ කාර්යයන්

- කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වාගෙන යාම.
- කාර්යාලයේ සේවක සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම.
- තාර්කික අයුරින් කාර්ය මණ්ඩලයට කාර්යාලයීය රාජකාරි වෙන් කිරීම.
- රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ වැඩකටයුතු සිදු කිරීම.
- ගරු විපක්ෂ නායකතුමාගේ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ සහ විපක්ෂයේ නියෝජ්‍ය සවිධායකතුමන්ලාගේ පුද්ගලික කාර්ය මණ්ඩලය වෙත පත්වීම් ලිපි, සේවය අවසන් කිරීමේ ලිපි නිකුත් කිරීම.
- විපක්ෂ කණ්ඩායමේ ගරු මන්ත්‍රීවරුන් විදේශගත වීමට අදහස් කරන විටදී ගරු විපක්ෂ නායකතුමාගේ අනුමැතිය ලබාගැනීම.
- තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත අයදුම්පත් සහතික කිරීම.

1.3.3. පරිපාලන අංශයේ කාර්යයන්

- ❖ කාර්ය මණ්ඩලයේ ණය, අතිකාල හා නිවාඩු අනුමත කිරීම.
- ❖ පුහුණු සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.
- ❖ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ පුහුණු වැඩසටහන්වලට යොමු කිරීම.
- ❖ වාහන සංචිතය කළමනාකරණය සහ නඩත්තුව.
- ❖ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ❖ කාර්යාලයේ ගබඩාව නිසි ලෙස නඩත්තු කිරීම.
- ❖ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා භාණ්ඩ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යාම.
- ❖ කාර්යාලයේ ලිපිගොනු කළමනාකරණය
- ❖ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.
- ❖ සේවා ගිවිසුම්වලට එළැඹීම.
- ❖ කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටි විපක්ෂ නායක කාර්යාලයට අදාළ පරිපාලන කටයුතු.

1.3.4. ගිණුම් අංශයේ කාර්යයන්

- ❖ විපක්ෂ නායක කාර්යාලය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කිරීම.
- ❖ සියලුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම හා ඒ සම්බන්ධ කටයුතු.
- ❖ CIGAS සහ ITMIS මගින් ලෙජර, වාර්තා පවත්වාගෙන යාම සහ දෛනික ගනුදෙනු සැසඳීම.
- ❖ දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ සමග සැසඳීම.
- ❖ මාසික වැටුප් සකස් කිරීම හා ගෙවීම.
- ❖ මාසික ගිණුම් සාරාංශය සැකසීම හා ඉදිරිපත් කිරීම.
- ❖ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම.
- ❖ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.
- ❖ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයනට අනුව වාර්ෂික ගිණුම් වසා දැමීම.
- ❖ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සම්බන්ධ කටයුතු.

1.4. විපක්ෂ නායක කාර්යාලයේ සංයුතිය

ගරු විපක්ෂ නායකතුමාගේ ස්ථීර කාර්ය මණ්ඩල

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ලේකම්	01	01	-
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	01	-	01
ගණකාධිකාරි	01	01	-
සහකාර ලේකම්	02	01	01
පරිපාලන නිලධාරි	01	01	-
භාෂා පරිවර්තක	02	02	-
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	01	01	-
සංඛ්‍යා ලේඛන නිලධාරි	01	-	01
සංවර්ධන නිලධාරි	05	05	-
කළමනාකරණ සේවා නිලධාරි	12	09	03
රියදුරු	13	12	01
කාර්යාලක සේවක සේවය	10	10	-
එකතුව	**50**	**43**	**07**

ගරු විපක්ෂ නායකතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	01	-	01
සම්බන්ධීකරණ ලේකම්	02	01	01
මාධ්‍ය ලේකම්	01	01	-
මහජන සම්බන්ධතා නිලධාරි	01	01	-
පුද්ගලික සහකාර	01	01	-
කළමනාකරණ සේවා නිලධාරි	05	05	-
රියදුරු	02	02	-
කාර්යාල සේවක සේවය	02	-	02
එකතුව	**15**	**11**	**04**

ගරු විපක්ෂ නායකතුමාගේ තාවකාලික කාර්ය මණ්ඩලය

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
කළමනාකරණ සේවා නිලධාරි	08	08	-
පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු	02	02	-
ඡායාරූප ශිල්පී	01	01	-
විඩියෝ කැමරා ශිල්පී	01	01	-
රියදුරු	07	07	-
කාර්යාල සේවක සේවය	02	02	-
බංගලා භාරකරු	02	01	01
මුරකරු	01	01	-
අරක්කැමි	02	02	-
සනීපාරක්ෂක කම්කරු	01	01	-
එකතුව	**27**	**26**	**01**

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	01	01	-
සම්බන්ධීකරණ ලේකම්	01	01	-
මාධ්‍ය ලේකම්	01	01	-
මහජන සම්බන්ධතා නිලධාරි	01	01	-
කළමනාකරණ සේවා නිලධාරි	03	03	-
රියදුරු	02	02	-
කාර්යාල සේවක සේවය	02	02	-
එකතුව	**11**	**11**	**00**

ගරු විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	02	02	-
සම්බන්ධීකරණ ලේකම්	02	02	-
මාධ්‍ය ලේකම්	02	01	01
මහජන සම්බන්ධතා නිලධාරි	02	01	01
කළමනාකරණ සේවා නිලධාරි	06	06	-
රියදුරු	04	04	-
කාර්යාල සේවක සේවය	04	04	-
එකතුව	**22**	**20**	**02**

1.5 ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයේදී විපක්ෂයේ කාර්යභාරය


- තිරසාර සංවර්ධනයේ මූලික කාර්යයන්
  - පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණය සහ වගවීම
  - විකල්ප ප්‍රතිපත්ති සංවර්ධනය
  - සියලු පාර්ශ්ව නියෝජනය ශක්තිමත් කිරීම

- උපායමාර්ගික ප්‍රවේශයන්
  - සර්වපාක්ෂික සහයෝගිතාව
  - ජාත්‍යන්තර හවුල්කාරිත්වය සහ උපදේශනය
  - අධීක්ෂණ සහ ඇගයීමේ විශිෂ්ටත්වය
  - දේශගුණික නායකත්වය සහ පරිසර ක්‍රියාමාර්ග

- තිරසාර අනාගතයක් ගොඩනැගීම

1.6 ආයතනික සටහන

ගරු විපක්ෂ නායකතුමාගේ උපදෙස් හා පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ මඟ පෙන්වීම යටතේ විපක්ෂ නායක ලේකම් විසින් මෙම කාර්යාලයේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.



.

02 පරිච්ඡේදය

ප්‍රගතිය

2024 වසරේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු දෙකක වෙනස්වීම් සිදුවිය. 2024 වසරේ සැප්තැම්බර් 24 දක්වා ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් පොදුජන එක්සත් පෙරමුණ ප්‍රමුඛ කොටගත් ආණ්ඩුවක් යටතේ 09 වැනි පාර්ලිමේන්තුව ක්‍රියාත්මක විණි. එම කාල සීමාව තුළ පාර්ලිමේන්තුවේ විපක්ෂනායකවරයා ලෙස කටයුතු කරන ලද්දේ ද වර්තමාන ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා වේ.

2024 නොවැම්බර් 21 පැවැති මහ මැතිවරණයෙන් පසු ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් ජාතික ජන බලවේගය මුලික කර ගනිමින් 10 වැනි පාර්ලිමේන්තුව ආරම්භ විය. එම පාර්ලිමේන්තුවේ විපක්ෂයේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් හිමි කර ගනිමින් සමගි ජන බලවේගයේ නායකයා වශයෙන් සජිත් ප්‍රේමදාස මහතා යළිත් විපක්ෂනායක ධුරයට පත්විය.

10 වැනි පාර්ලිමේන්තුවේ විපක්ෂනායක කාර්යාලයේ නව ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් වන සුරංග රණසිංහ මහතා පත් කරන ලදි.

ස්ථාවර මූල්‍ය විනයක්ද පවත්වා ගනිමින් විපක්ෂ නායක කාර්යාලය විසින් 2024 වසර තුළ සියලු ක්ෂේත්‍රයන්හි යහපත් ප්‍රගතියක් පෙන්වා ඇත.

2.1. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න

	2024
ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂ නායකතුමා විසින් අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව.	28
ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂයේ වෙනත් පක්ෂ නායකයින් විසින් අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව.	09
ස්ථාවර නියෝග 27(2) යටතේ අසා ඇති මුළු ප්‍රශ්න සංඛ්‍යාව.	37

2.2 කාලීන වැදගත් සිදුවීම් පිළිබඳ තොරතුරු

අදාළ වන අමාත්‍යාංශවල අවධානය යොමු කරලීම සඳහා පොදු වැදගත්කමකින් යුතු කාලීන ප්‍රශ්න සහ ගැටලු සම්බන්ධ තොරතුරු පිළිබඳ සාරාංශ 2023 වර්ෂය තුළ 150ක් සකස් කර ලබා දී ඇති අතර 2024 වර්ෂය තුළදී එම වාර්තා ගණන 250ක් දක්වා වැඩි වී ඇත.

2.3 සභාව කල් තබන අවස්ථාවේ දී ප්‍රශ්න

2024 වර්ෂය තුළදී ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න 10ක් පාර්ලිමේන්තු මහලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

2.4 අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්න

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු පිණිස ඉදිරිපත් කරන ලද ප්‍රශ්න 08ක් පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කරන ලදි.

2.5 වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් වාචික ප්‍රශ්න 2190ක් පමණ ඉදිරිපත් කර ඇත. එය 2023 වර්ෂයේ දී 1572කි.

2.6 සභාව කල් තබන අවස්ථාවේ දී විවාදයට ගෙන එනු ලබන යෝජනා

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනා 16ක් පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලදි.

අනු අංකය	දිනය	ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා / මන්ත්‍රීතුමිය	අදාළ කරුණ
01	2024.01.11	ගරු කබීර් හෂිම් මැතිතුමා	රටේ ආර්ථික බංකොලොත්භාවය සම්බන්ධව
02	2024.02.21	ගරු තුෂාර ඉඳුනිල් මැතිතුමා	ජීවන වියදම් සම්බන්ධව
03	2024.03.06	ගරු හේෂා විතාන මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල සම්බන්ධව
04	2024.03.22	ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා	වර්තමානගේ වී ගොවීන් මුහුණ දී ඇති ප්‍රශ්න සම්බන්ධව
05	2024.04.02	ගරු රෝහිණි කුමාරි විජේරත්න මැතිණිය	සුව සැරිය ගිලන් රථ සම්බන්ධව
06	2024.04.24	ගරු නිරෝෂණ පෙරේරා මැතිතුමා	පාස්කු ප්‍රහාරය සම්බන්ධව
07	2024.05.09	ගරු චැල්ස් නිර්මලනාදන් මැතිතුමා	මන්නාරම් දිස්ත්‍රික්කයේ නානාට්ටාන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සම්බන්ධව
08	2024.05.13	ගරු රවුෆ් හකීම් මැතිතුමා	ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර යුද්ධය සම්බන්ධව
09	2024.05.22	ගරු ලක්ෂමන් කිරිඇල්ල මැතිතුමා	නීති අධ්‍යාපනය සම්බන්ධව
10	2024.06.05	ගරු රෝහිණි කුමාරි විජේරත්න මැතිණිය	නිදහස් අධ්‍යාපනය සම්බන්ධව
11	2024.07.11	ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීති සම්බන්ධව
12	2024.09.22	ගරු හේෂා විතානගේ මැතිතුමා	පාසල් අධ්‍යාපනයේ අවිධිමත්භාවය නිදහස් අධ්‍යාපනය සම්බන්ධව
13	2024.07.31	ගරු බුද්ධික පතිරණ මැතිතුමා	ගොංගල හා රක්වාන කඳු පන්තිය නිදහස් අධ්‍යාපනය සම්බන්ධව
14	2024.09.04	ගරු රෝහිණි කුමාරි විජේරත්න මැතිණිය	වන අලි හා ගැටලු නිදහස් අධ්‍යාපනය සම්බන්ධව
15	2024.12.04	ගරු රිෂාඩ් බදුර්දීන් මැතිතුමා	බෙංගාල බොක්ක ආශ්‍රිතව පසුගිය දින කිහියපයකට පෙර ඇති වූ හෙංගල් සුළි කුණාටුව නිදහස් අධ්‍යාපනය සම්බන්ධව
16	2024.12.17	ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා	දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධව

2.7 පනත් කෙටුම්පත්, නීති හා රෙගුලාසි සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදු කිරීම

2024 වර්ෂය තුළ දී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අදාළ ආයතන විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් 58 කි. පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සඳහා සංශෝධන 45ක් විපක්ෂය විසින් ඉදිරිපත් කර ඇත. නියෝග හා රෙගුලාසි 112ක් සම්බන්ධයෙන් පර්යේෂණයන් සිදු කර පර්යේෂණ ලිපි ගරු විපක්ෂ නායකතුමා සහ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානයට යොමු කර ඇත. පනත් 04ක් සඳහා ගරු විපක්ෂ මන්ත්‍රීවරුන් යොමු කළ කරුණු අනුව සංශෝධන සකස් කිරීම සඳහා න්‍යායික හා තාක්ෂණික සටහන් ලබා දෙන ලදි.

අනු අංකය	සංශෝධනය සඳහා ඉදිරිපත් කළ පනත් නාමය
01	මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත
02	ශ්‍රී ලංකා විදුලිබල පනත
03	බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන සංශෝධන) පනත
04	කාන්තා සවිබල ගැන්වීමේ පනත

අනු අංකය	2024 වර්ෂය තුළ දී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අදාළ ආයතන විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත්
01	සත්ව සුඛසාධන පනත් කෙටුම්පත
02	නැව් නියෝජිතයන්ට නැව් බඩු ගෙනයන්නට යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය සඳහා වූ කෙටුම්පත
03	කාලාවරෝධ සංශෝධනය පනත් කෙටුම්පත
04	ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත
05	බෙදුම් නඩු සංශෝධන පනත් කෙටුම්පත
06	ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත
07	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පනත යටතේ වාර්තාව
08	ආගමන පනත් කෙටුම්පත
09	වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
10	වෛද්‍ය පනත් කෙටුම්පත
11	අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
12	ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත් කෙටුම්පත
13	ආරක්ෂණ පියවර (සංශෝධන) පනත් කෙටුම්පත

14	දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
15	සමථ මණ්ඩල(සංශෝධන) පනත් කෙටුම්පත
16	මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත
17	සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත
18	රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත
19	දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
20	ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
21	අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
22	පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත
23	විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත
24	ශ්‍රී ලංකාවේ සමගිය සහ ප්‍රතිසංවිධානය සඳහා වන කොමිෂන් සභා පනත් කෙටුම්පත
25	ජාතික ඉඩම් කොමිෂන් සභා පනත් කෙටුම්පත
26	සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
27	අධිකරණයට, විනිශ්චයාධිකාරයට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පත
28	ජාතික සමගිය සහ ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය පනත
29	ජාතික ජලශාස්ත්‍රීය පනත
30	සමථකරණය තුළින් ඇතිවන්නාවූ අන්තර් ජාතික ගිවිසුම පිළිගැනීමේ හා බලාත්මක කිරීම පනත
31	සමථ මණ්ඩල (සංශෝධන) පනත
32	ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත
33	වංචා වැළැක්වීම (සංශෝධන) පනත
34	නොතාරිස් (සංශෝධන) පනත
35	සුරක්ෂිත ලත් ගනුදෙනු පනත
36	භාර ලදුපත් (සංශෝධන) පනත
37	උකස් (සංශෝධන) පනත
38	කාල්බදු මූල්‍යකර (සංශෝධන) පනත
39	දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත
40	සමාගම් (සංශෝධනය) පනත
41	ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත
42	එකතු කළ අගය මත බදු පනත
43	සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත
44	ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත
45	සාජ්පු සහ කාර්යාල සේවකයින් (රැකියා සහ වේතන නියාමනය) (සංශෝධන) පනත
46	බැංකු පනත් කෙටුම්පත පනත
47	දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

48	අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) පනත
49	බැංකු මගින් ප්‍රධානය කරනු ලබන ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත(සංශෝධන) පනත
50	බෙදුම් නඩු සංශෝධන පනත
51	ශ්‍රී ලංකා විදුලිබල පනත
52	රාජ්‍ය ණය කළමනාකරණ පනත
53	කාන්තා සවිබල ගැන්වීමේ පනත
54	ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත
55	සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත
56	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත
57	ආර්ථික පරිවර්තන පනත
58	යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත

2024 වර්ෂයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනත් රෙගුලාසි 112කට අදාළ පසුබිම් වාර්තා 112ක් සකස් කර ඇති අතර එම අතිවිශේෂ ගැසට් පත්‍ර අංක සහ දිනයන් ද සහිතව මෙහි දක්වා ඇත.

	පනත් නියෝග/රෙගුලාසි	**අතිවිශේෂ අංකය හා ගැසට් පත්‍රයේ දිනය**
1	ආනයන හා අපනයන පනත (පාලන)	2296/30 2022.09.09
2	ආනයන හා අපනයන පනත (පාලන)	2324/45 2023.03.24
3	පුරාවස්තු ආඥාපනත (188 අධිකාරය)	2023.05.23
4	නීති අධ්‍යාපන සභා ආඥාපනත	2332/02 2023.05.15
5	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග	2355/30 2023.10.25
6	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ නියෝග	2334/39 2023.06.01
7	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2356/20 2023.11.01
8	අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2238/34 2021.07.30
9	අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2303/23 2022.10.26
10	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2365/29 2024.01.03
11	විදේශ විනිමය පනත යටතේ නියමය	2363/26 2023.12.20
12	අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2362/67 2023.12.14
13	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝග	2360/36 2023.11.28

14	සංචාරක කටයුතු පනත යටතේ නියෝග	2348/38 2023.09.07
15	සංචාරක කටයුතු පනත යටතේ නියෝග	2354/22 2023.10.19 2349/02 2023.09.11
16	මෝටර් වාහන පනත යටතේ නියෝග	2338/39 2023.06.28
17	මෝටර් වාහන පනත යටතේ නියෝග	2352/29 2023.10.05
18	ආනයන හා අපනයන (පාලන)	2366/19
19	අත්‍යාවශ්‍ය සේවා මහජන පනත යටතේ ප්‍රකාශය	2369/58
20	විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනත යටතේ නියෝග	2360/21
21	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග	2358/70 2023.11.17
22	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2371/11 2024.02.13
23	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2371/16 2024.02.13
24	සංචාරක කටයුතු පනත යටතේ නියෝග	2352/47 2023.10.06
25	සංචාරක කටයුතු පනත යටතේ නියෝග	2352/48 2023.10.06
26	රාජ්‍ය තාන්ත්‍රික වරප්‍රසාද පනත යටතේ නියෝග	2348/48 2023.09.08
27	වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝග	2350/45 2023.09.21
28	එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය	2363/22 2023.12.19
29	ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත	2311/40 2022.12.22
30	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2373/59 2024.03.03
31	විශ්වවිද්‍යාල පනත	2326/11
32	හිමිකම් ලියාපදිංචි කිරීමේ නියමය	2308/27 2022.12.01
33	ආනයන හා අපනයන පනත (පාලන)	2370/15 2024.02.07
34	ඛනිජ තෙල් නිෂ්පාදන විශේෂ විධිවිධාන	2340/02 2023.07.10
35	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යටතේ නියමය	2366/13 2024.01.09
36	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යටතේ නියමය	2366/14 2024.01.09
37	සිවිල් ගුවන්සේවා පනත යටතේ රෙගුලාසි	2362/23 2023.12.12
38	ආනයන හා අපනයන පනතේ රෙගුලාසි (පාලන)	2373/28 2024.02.28
39	ආගාමික හා විගාමික පනත යටතේ නියෝග	3/22/2024
40	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2361/44 2023.12.08
41	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2364/35 2023.12.31
42	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2364/36 2023.12.31
43	වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය	2364/37 2023.12.31

44	කැසිනෝ ව්‍යාපාර පනත යටතේ රෙගුලාසි (නියාමන)	2366/33 2024.01.12
45	සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ රෙගුලාසි	2366/34 2024.01.12
46	මුදල් පනත යටතේ නිවේදන	2368/24 2024.01.24
47	මුදල් පනත යටතේ නියෝග	2369/27 2024.02.01
48	කැසිනෝ ව්‍යාපාර පනත යටතේ රෙගුලාසි (නියාමන)	2369/42 2024.02.02
49	විදේශ විනිමය පනත යටතේ නියමය	2371/33 2024.02.15
50	මුදල් පනත යටතේ නියෝගය	2374/19 2024.03.06
51	රේගු පනත යටතේ නියමය (සංශෝධන)	2371/32 2024.02.15
52	විදේශ විනිමය පනත යටතේ නියෝග	2371/48 2024.02.16
53	විදේශ විනිමය පනත යටතේ නියෝග	2371/49 2024.02.16
54	විදේශ විනිමය පනත යටතේ නියෝග	2371/50 2024.02.16
55	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2376/14 2024.03.19
56	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශන	2380/32 2024.04.19
57	අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2360/22 2023.11.27
58	අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2371/13 2024.02.13
59	සංචාරක කටයුතු පනත යටතේ නියමය	2360/62 2023.12.01
60	සංචාරක කටයුතු පනත යටතේ නියමය	2360/63 2023.12.01
61	ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනත යටතේ නියෝග	2373/14 2024.02.27
62	රජයේ ඉඩම් ආඥාපනත යටතේ නියෝග	4/9/2024
63	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2360/52 2023.11.30
64	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2365/04 2024.01.02
65	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2365/84 2024.01.07
66	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2372/06 2024.02.19
67	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2373/42 2024.03.01
68	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය	2365/50 2024.01.04
69	රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය	2365/51 2024.01.04
70	දේශීය ආදායම් පනත යටතේ නියෝග (සංශෝධන)	2376/25 2024.03.21
71	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2379/03 2024.04.08
72	ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග	2374/17 2024.03.05
73	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝග	2377/41 2024.03.28
74	සුඛසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග	2382/02 2024.04.29

75	අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2385/11 2024.05.21
76	සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග	2384/30 2024.05.17
77	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2381/24 2024.04.22
78	අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2387/11 2024.06.04
79	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2366/38 2024.01.12
80	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2369/32 2024.02.01
81	සුරාබදු ආඥා පනත යටතේ නිවේදන	2381/16 2024.04.22
82	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2384/34 2024.05.17
83	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2384/35 2024.05.17
84	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2390/28 2024.06.29
85	අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2391/27 2024.07.04
86	රේගු පනත (සංශෝධන) යටතේ නියමය	2389/07 2024.06.18
87	සංචාරක කටයුතු පනත යටතේ නියමය	2364/29 2023.12.28
88	සුරාබදු ආඥාපනත යටතේ නිවේදන	2366/39 2024.01.12
89	ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග	2381/23 2024.04.22
90	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2387/38 2024.06.06
91	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2380/33 2024.04.19
92	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2380/35 2024.04.19
93	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2380/34 2024.04.19
94	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2380/36 2024.04.19
95	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය	2382/33 2024.05.03
96	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2390/19 2024.06.28
97	විදේශ විනිමය පනත යටතේ නියමය	2389/08 2024.07.18
98	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2383/34 2024.05.09
99	බනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග	2393/11 2024.07.15
100	අත්‍යවශ්‍ය මහජන පනත යටතේ ප්‍රකාශනය	2396/04
101	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2394/66 2024.07.26
102	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2394/67 2024.07.26
103	ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි	2393/36 2024.07.18

104	ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග	2382/11 2024.04.30
105	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය	2396/60 2024.08.09
106	ශ්‍රී ලංකා මහබැංකු පනත යටතේ රීති	2391/02 2024.07.01
107	කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ පනත යටතේ (නියෝගය	2386/09 2024.05.29
108	වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය	2377/39 2024.03.28
109	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2394/68 2024.07.26
110	ජාතික ක්‍රීඩා සංගම් නියෝග	2382/32 2024.05.03
111	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියමය	2327/33 2023.04.11 2397/28 2024.09.14
112	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියෝග	2339/09 2023.07.04

2.8 විශ්වාසභංග යෝජනා

පාර්ලිමේන්තු කථානායකට මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් පාර්ලිමේන්තුව වෙත විපක්ෂය විසින් ගෙන ආ අතර 2024.03.19, 20, 21 යන දිනයන් හිදී එය විවාදයට ගැණිනි.

2.9 විදේශ දූත පිරිස් හා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සමග හමුවීම

පාර්ලිමේන්තු හා ව්‍යවස්ථාදායක කාර්යයන් සම්බන්ධයෙන් ගරු විපක්ෂනායකතුමා හමුවීමට මෙරටට පැමිණෙන විදේශ දූත කණ්ඩායම්, රාජ්‍ය තාන්ත්‍රිකයන් හා සෙසු ප්‍රභූන් සමග අදහස් හා ආකල්ප හුවමාරු කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වා ඇති අතර ඒ අනුව 2024 වර්ෂය තුළ දී ගරු විපක්ෂ නායකතුමා විදේශ දූත මණ්ඩල හා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සමඟ සම්බන්ධතා තර ගැනීමට රැස්වීම් 13ක් පවත්වා ඇත.

2.10 මහජන ගැටලු පිළිබඳ කටයුතු කිරීම

මහජන ගැටලු සම්බන්ධයෙන් විපක්ෂනායක තුමා වෙත පැමිණිලි හා දුක් ගැනවිලි ලිපි 1765ක් ලැබී ඇත. ඒ අතරින් අදාළ ආයතනයන් වෙත ලිපි 1115ක් ඉදිරිපත් කර ඇත.

2.11 පාර්ලිමේන්තු විවාද සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය

- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ගන්නා ලද තීරණ ප්‍රකාර පාර්ලිමේන්තු වැඩසටහන් සකස් කොට ලිපි, ෆැක්ස්, කෙටි පණිවිඩ, WhatsApp හා දුරකථන ඇමතුම් මගින් පාර්ලිමේන්තු රැස්වීම් දින 58කට අදාළ වැඩසටහන් පිළිබඳව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරන ලදී.
- විපක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු විවාදවලට සහභාගිවන කථිකයන්ගේ ලැයිස්තුව සකසා ඔවුන්ගේ කථා සඳහා අවශ්‍ය කාල වේලාවන් වෙන් කිරීම සඳහා කථික ලැයිස්තු 58 කට ආසන්න ප්‍රමාණයක් සකස් කර දෙන ලදී.
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් සංශෝධන සම්බන්ධයෙන් විපක්ෂය විසින් ඉල්ලීම් කරන ලද ඡන්ද විමසීම් ගණන 04කි.
- විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විවාද සඳහා සහභාගී වීමට අවශ්‍ය වන, ලේඛන 1800ක් පමණ භාෂා පරිවර්තනය කිරීමට පියවර ගන්නා ලදී.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉල්ලා සිටින විටදී විවාද කථා ඇතුළත් සංයුක්ත තැටි 57ක් හා ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම පරිදි සකස් කරන ලද විඩියෝ පට 551ක් මාර්ග ගත ක්‍රම ඔස්සේ ද ලබා දීමට කටයුතු කරන ලදී .

2.12 අතුරුසම්මත ගිණුම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු

2025 අයවැය ඉලක්ක කර ගනිමින් වඩා හරවත් හා අර්ථවත් විවාදයක් පැවැත්වීමටත් විෂයානුබද්ධ කරුණු තුළින් වඩා ඵලදායී විවාදයක් බවට පත්කර ගැනීම සඳහාත් විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් අවශ්‍ය තොරතුරු සපයා දෙන ලදි.

2024 වර්ෂයේ අයවැය යෝජනා අනුව එක් එක් අමාත්‍යාංශ වෙත ලබා දුන් ප්‍රතිපාදන හා ඒවායෙහි භාවිතය විශ්ලේෂණය කර, ඒය ආර්ථිකයට දායකත්වය ලබා දී ඇති ආකාරය පිළිබඳ පර්යේෂණාත්මක තොරතුරු එක් රැස් කර මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම.

2.13 පාර්ලිමේන්තුවේ කමිටු පවත්වාගෙන යාම සඳහා දායකත්වය

පාර්ලිමේන්තු කමිටු හා අමාත්‍යාංශ උපදේශක කාරක සභා සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම මගින් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය පවත්වා ගැනීම මෙන් ම මහජන නියෝජිතයින්ට අමාත්‍යාංශ කටයුතු කෙරෙහි දායකත්වය ලබා දීමට අවශ්‍ය සහය ලබා දෙන ලදී.

මේ යටතේ මහජන නියෝජිතයින්ගෙන් සැදුම්ලත් පාර්ලිමේන්තු කමිටු, උපදේශක කාරක සභා සහ ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා 2024 වසර තුළ තෙවන සභාවාරය සහ සිව්වන සභාවාරය හා පස්වන සභාවාරය තුළ පහත සඳහන් පරිදි සාමාජික නාම යෝජනා ලබා දීම.

අනු අංකය	කමිටු නාමය කාරක සභාවේ නම	තෙවන සභාවාරය	සිව්වන සභාවාරය	පස්වන සභාවාරය
01	පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව	10	10	10
02	තේරීම් කාරක සභාව	5	5	5
03	ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව	-	3	3
04	ගෘහ්‍ය කාරක සභාව	-	4	4
05	ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව	-	5	7
06	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව	12	12	12
07	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව	12	12	12
08	රජයේ මුදල් පිළිබඳ කාරක සභාව	10	10	10
09	මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව	-	8	8
10	පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව	-	8	8
11	ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව	-	5	5
12	අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා	2	2	2
13	ආංශික අධීක්ෂණ කාරක සභා	5	5	5

2.14 ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම

අභාවප්‍රාප්ත පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ශෝක යෝජනා සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් 2024 වර්ෂය තුළ පාර්ලිමේන්තුවේ ශෝක ප්‍රකාශ සිදු කරන ලදී.

01. ගරු ඒ.එච්.එම් අලවි මැතිතුමා
02. ගරු නජීබ් අබ්දුල් ජේඩ් මැතිතුමා
03. ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා
04. ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා
05. ගරු රොනි ද මැල් මැතිතුමා
06. ගරු අසෝක ජයවර්ධන මැතිතුමා
07. ගරු ආර්.එම් කරුණාරත්න මැතිතුමා
08. ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මැතිතුමා
09. ගරු බන්දුල බස්නායක මැතිතුමා
10. ගරු යූ.එල්.එම් ෆාරුක් මැතිතුමා
11. ගරු වෛද්‍ය පී.එම්.බී.සිරිල් මැතිතුමා
12. ගරු සනත් නිශාන්ත මැතිතුමා

2.15 නිල මැදිරි රාජකාරි

පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන ලද අවස්ථාවන්හි දී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම සම්බන්ධීකරණ කිරීම සඳහා මෙම කාර්යාලයේ නිලධාරීන් නිල මැදිරි රාජකාරියේ යොදවනු ලැබීය.

2.16 පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පත් කිරීමට විපක්ෂය විසින් කරන ලද යෝජනා

කරන ලද යෝජනා

මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර මඟින් පැන නැගී ඇති ගැටලු පිළිබඳව ගැඹුරින් විමර්ශනය කර නව ප්‍රතිනිර්මාණ යෝජනාවලියක් සැකසීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන්

ගරු බුද්ධික පතිරන මහතා
ගරු නීතිඥ ලක්ෂ්මන් කිරි ඇල්ල මහතා
ගරු අලී සබ්රි රහීම් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා

2.17 මන්ත්‍රීවරුන් වෙනුවෙන් සපයන ලද වෙනත් සේවාවන්

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට (මාස තුනක් ඉක්මයාමට පෙර) පාර්ලිමේන්තු සැසිවලට සහභාගි නොවී සිටීම සඳහා අවසර පතා ඉදිරිපත් කෙරෙන යෝජනා 06ක් සකස් කිරීම හා ඒවා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගනු පිණිස පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම 2024 වර්ෂය තුළ සිදු කරන ලදී.

- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ නිවාඩු අයදුම්පත් 12ක් පමණ අනුමැතිය පිණිස ගරු විපක්ෂ නායකතුමා වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

- විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් අවස්ථා 11ක් පිළිබඳ දැනුවත් කිරීම් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

- විපක්ෂයේ පක්ෂ විධායක කමිටු රැස්වීම් සංඛ්‍යාව 25ක් සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලද අතර කණ්ඩායම් රැස්වීම් න්‍යාය පත්‍ර 25ක් සහ ඊට අදාළ පසුබිම් සටහන් 25ක් පමණ පාර්ලිමේන්තු කටයුතුවලට අදාළව සංවිධානය කර ඇත.

2.18 ආයතන අංශයෙහි කාර්යයන්හි ප්‍රගතිය

- කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු 121ක් යාවත්කාලීනව නිසි පරිදි පවත්වාගෙන යාම.

- ආයතන අංශයට අදාළ තොරතුරු කඩිනමින් හා නිවැරදිව ලබා ගැනීම, වාර්තා තබාගැනීම හා බෙදා හැරීම.

- 2024 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා පුහුණු වැඩසටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.

2.18.1 විපක්ෂ නායක කාර්යාලයේ රජයේ නිලධාරීන් සඳහා සිදුකළ කටයුතු

- කාර්යාලයේ සේවක සංඛ්‍යාවෙහි පවත්නා පුරප්පාඩු පිරවීම.
- කාර්ය මණ්ඩලය වෙත තාර්කික ආකාරයෙන් රාජකාරි ලැයිස්තු ලබා දීම.
- සේවා නියුක්තිකයන් අදියර පදනමින් පුහුණු වැඩසටහන්වලට යොමු කිරීම.
- විශ්‍රාම යාමට නියමිත කාර්යාලයීය කාර්ය මණ්ඩලයට අදාළ කටයුතු සිදු කිරීම.

2.18.2 පෞද්ගලික හා තාවකාලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් සිදුකළ කටයුතු

- ගරු විපක්ෂ නායකතුමාගේ, ප්‍රධාන සංවිධායකතුමාගේ හා නියෝජ්‍ය සංවිධායකවරුන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩලය හා තාවකාලික කාර්ය මණ්ඩලය වෙත පත්වීම් ලිපි, සේවය අවසන් කිරීමේ ලිපි නිකුත් කිරීම.
- PSPF අයදුම්පත් සකස් කිරීම හා අදාළ ආයතනය වෙත යොමු කිරීම.

2.19 පරිපාලන අංශයේ කාර්යයන්හි ප්‍රගතිය

- විපක්ෂ නායක කාර්යාලයේ වැඩ හා සේවා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු 36ක් පමණ නිම කිරීම.
- විපක්ෂනායක කාර්යාලයේ ඇති උපකරණ හා සේවාවන් සඳහා සේවා ගිවිසුම්වලට එලඹීම හා අලුත් කිරීම.
- වාහන 26ක් සම්බන්ධව වාර්තා සහ වාහන නඩත්තු සිදු කරමින් වාහන සංචිතය නිසි පරිදි පවත්වාගෙන යාම හා අවශ්‍ය පරිදි ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන ලියාපදිංචි කිරීම, අනුයුක්ත කිරීම, රක්ෂණ හා ඉන්ධන සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- විපක්ෂ නායක කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ගෘහ පාලක දෙපාර්තමේන්තුව සමගින් කටයුතු කිරීම.
- කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් අයිතම කාර්ය මණ්ඩලය වෙත සපයා දීම
- කාර්යාලීය භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වගෙන යාම.
- කාර්යාලයේ නිවාඩු ලේඛනය නිසි පිරිදි පවත්වාගෙන යාම.
- පුහුණු සංවර්ධන සැළැස්මක් සකස් කිරීම.

2.19.1 විපක්ෂ නායක කාර්යාලයේ මාධ්‍ය අංශයක් ස්ථාපිත කිරීම.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ මාධ්‍ය ලේකම්තුමාගේ මෙහෙයවීම යටතේ විපක්ෂ නායක කාර්යාලයේ මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කරල ලද අතර විපක්ෂනායක කාර්යාලයේ වෙබ් අඩවිය, අනෙකුත් නිල සමාජ ජාල සමඟ නිල මාධ්‍ය සම්බන්ධීකරණය, සංවිධානය කිරීම සඳහා මූලික පියවර ආරම්භ කරන ලදී.

2.19.2 විපක්ෂනායක කාර්යාලයේ වෙබ් අඩවිය නිර්මාණය හා යාවත්කාලීන කිරීම.

- 2024 වර්ෂයේදී, විපක්ෂ නායක කාර්යාලය සිය නිල වෙබ් අඩවිය සාර්ථකව දියත් කරන ලද අතර, www.oloparliament.gov.lk මගින් වෙබ් අඩවියට පිවිසිය හැකිවේ. එය තොරතුරු බෙදා හැරීම, මහජනතාව සමඟ සම්බන්ධ වීම සහ විපක්ෂ නායක කාර්යාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස ක්‍රියා කරයි.
- මෙම වෙබ් අඩවිය විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂ නායක කාර්යාලයේ ක්‍රියාකාරකම්, පුවත් සහ වැදගත් නිවේදන පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් සපයමින් අවශ්‍ය තොරතුරු ඉක්මනින් සොයා ගත හැකි අයුරින් විවිධ අංශ වෙත පහසු සංචලනයක් ලබා දීමට හැකිවන සේ සැලසුම් කර ඇත.
- පාර්ලිමේන්තුවේ කටයුතු සඳහා සහාය වන පනත් සංශෝධන, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සහ අනෙකුත් වැදගත් ලියකියවිලි එහි ඇතුළත් වේ. විපක්ෂ නායක කාර්යාලයේ සංවිධාන ධුරාවලිය එක් එක් අංශ සහ වගකීම් ගෙනහැර දක්වන අතර එමඟින් සංවිධානය තුළ වගවීමද දක්වා ඇත.
- වෙබ් අඩවිය මගින් ව්‍යවස්ථාදායක ක්‍රියාකාරකම්, මාධ්‍ය නිවේදන සහ නිල ප්‍රකාශයන් පිළිබඳ නිතිපතා යාවත්කාලීන තොරතුරු සොයා බැලීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර, ඒ සඳහා වැදගත් තොරතුරු ඇතුළත් කර ඇත.
- වෙබ් අඩවිය මහජන සහභාගීත්වය වැඩි කිරීම සඳහා අවකාශ සපයනු ලබන අතර විපක්ෂ නායකවරයාගේ ක්‍රියාකාරකම් පිළිබඳව විමසීම් ඉදිරිපත් කිරීමට, ප්‍රතිපෝෂණ සැපයීමට හැකිවීම ආදිය මගින් මහජනයා සමඟ ඇති සම්බන්ධතාව වඩාත් වර්ධනය කර ඇත.

2.20 ගිණුම් අංශයේ කාර්යයන්හි ප්‍රගතිය

ගිණුම් අංශයේ ක්‍රියාවලිය තුළින් ආයතනයේ මුල්‍ය විනය පිළිබඹු කරන අතර පසුගිය කාලයේ ගිණුම් කටයුතු විධිමත් කරමින් මුල්‍ය හා අණපනත් යටතේ පවත්වාගෙන යා යුතු ගිණුම් ලේඛණ ආරම්භ කර යථාවත්ව පවත්වා ගනු ලැබීය. එමෙන්ම අභ්‍යන්තර හා බාහිර මුල්‍ය පාලන ක්‍රියාමාර්ග ගනිමින් නිරන්තර පසුවිපරම් ක්‍රියාවලියක් පවත්වා ගනිමින් මුල්‍ය අංශය ස්ථායි කිරීමට දැඩි අධිකාරියකින් ක්‍රියා කරනු ලැබීය.

එමගින් වසර කිහිපයකින් පසු ආයතනයේ මුල්‍ය තත්තවය පිළිබඳ විගණකාධිපති විසින් යහපත් මතයක් ප්‍රකාශ කිරීම අප ලැබූ ජයග්‍රහණයකි.

- ❖ විපක්ෂ නායක කාර්යාලය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව නියමිත කාලය තුළ සකස් කිරීම.
- ❖ සියලුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම හා ඒ සම්බන්ධ කටයුතු
- ❖ CIGAS සහ ITMIS මගින් ලෙජර, වාර්තා පවත්වාගෙන යාම සහ දෛනික ගනුදෙනු සැසඳීම් වාර්තා 200ක් පමණ හා වාර්ෂිකව ගිණුම් සාරාංශ 12ක් සකස් කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.
- ❖ දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර ගිණුම් සැසඳීම් සඳහා ප්‍රකාශ 12ක් සැකසීම
- ❖ මාසික ස්ථිර, පුද්ගලික හා තාවකාලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා මාසික වැටුප් ගෙවීම්
- ❖ මාසික අග්‍රිම සැසඳුම් ප්‍රකාශ 12ක් සැකසීම හා ඉදිරිපත් කිරීම.
- ❖ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ 12ක් සකස් කිරීම.
- ❖ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.
- ❖ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයන්ට අනුව 2024 ගිණුම් වසා දැමීම.
- ❖ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සම්බන්ධ මාසික සැසඳුම් ප්‍රකාශ 12ක් කාර්තු සැසඳුම් ප්‍රකාශ 04ක් සකස් කිරීම.
- ❖ පොදු තැන්පත් ගිණුමට අදාළව මාසික වාර්තා 12ක් කාර්තු වාර්තා 4 ක් සකස් කිරීම.
- ❖ මුදල් රෙගුලාසිවලට අනුකූලව කාලීනව ගිණුම් පවත්වගෙන යාම සහ ඊට සම්බන්ධ අනෙකුත් කාර්යයන් ඉටු කරමින් පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් නිසි කලට වේලාවට සපයාදීම.
- ❖ නිසි පරිදි අරමුදල් කළමණාකරණය, වියදම් පාලනය, පාර්ලිමේන්තු විපක්ෂනායක කාර්යාලට සහ අංක 30 විපක්ෂ නායක කාර්යාලයට අවශ්‍ය වට්ටෝරු භාණ්ඩ, කාර්යාල උපකරණ,හා ලිපි ද්‍රව්‍ය ප්‍රමාදයකින් තොරව සැපයීම.

03 පරිච්ඡේදය

2024 මහා මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නියෝජනය

2024 මහා මැතිවරණයෙන් ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවන පාර්ලිමේන්තුව 2024.11.21 වන දින උත්සවාකාරයෙන් රැස්විය. ඒ 2024 නොවැම්බර් 12 වන දිනැති අංක 2410/02 අති විශේෂ ගැසට් පත්‍රයට ප්‍රකාරවයි. ඒ අනුව විපක්ෂය ලෙස ප්‍රධාන දේශපාලන පක්ෂ 12ක් නියෝජනය වන පරිදි මන්ත්‍රීවරුන් 66ක් දසවන පාර්ලිමේන්තුවට තේරී පත් විය.

විපක්ෂයට තේරී පත් වූ මන්ත්‍රීවරු අතර වැඩිම මන්ත්‍රීවරු කණ්ඩායම හිමි සමගි ජන බලවේගයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා දසවන පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරයට තේරී පත්වූ අතර එතුමා 09 වන පාර්ලිමේන්තුවේ දීත් විපක්ෂ නායක ධුරයේ කටයුතු කරන ලදී.

3.1. විපක්ෂයේ ප්‍රධාන පක්ෂ හා ලබා ගත් ආසන සංඛ්‍යාව

	පක්ෂයේ නම	ලබාගත් මන්ත්‍රී ආසන සංඛ්‍යාව
1	සමගි ජන බලවේගය	40
2	ඉලගෙයි තමිල් අරසු කච්චි	08
3	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	05
4	ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ	03
5	ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	03
6	සර්ව ජන බලය	01
7	එක්සත් ජාතික පක්ෂය	01
8	ජනනායක තමිල් තේසීය කූට්ටනී පක්ෂය	01
9	අඛිල ඉලංගෙයි තමිල් කොංග්‍රස පක්ෂය	01
10	සමස්ථ ලංකා ද්‍රවිඩ සන්ධානය	01
11	යාපනය ස්වාධින කණ්ඩායම 17	01
12	ශ්‍රී ලංකා කම්කරු පක්ෂය	01

3.2 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා

3.3 විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය සංවිධායක

1. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
   ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා
2. විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
   ගරු අජිත් පී පෙරේරා මැතිතුමා
3. විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
   ගරු ජේ.සී අලවතුවල මැතිතුමා

3.4 විපක්ෂ නායක ලේකම්

විපක්ෂ නායක ලේකම් - සුරංග රණසිංහ මයා

3.5 විපක්ෂය නියෝජනය පක්ෂ හා මන්ත්‍රීවරුන්

3.5.1. සමගි ජන බලවේගය (40)

1. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා
2. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා
3. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා
4. ගරු රවුෆ් හකීම් මැතිතුමා
5. ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා
6. ගරු පලනි දිගම්බරම් මැතිතුමා
7. ගරු කබීර් හෂීම් මැතිතුමා
8. ගරු මනෝ ගනේෂන් මැතිතුමා
9. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා
10. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා
11. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා
12. ගරු අර්ජුන සුජීව සේනසිංහ මැතිතුමා
13. ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා
14. ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමා
15. ගරු ජේ.සී. අලවතුවල මැතිතුමා
16. ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා
17. ගරු හෙක්ටර් අප්පුහාමි මැතිතුමා
18. ගරු හේෂා විතානගේ මැතිතුමා
19. ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමා
20. ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමා
21. ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා
22. ගරු ඉම්රාන් මහරූෆ් මැතිතුමා
23. ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා
24. ගරු හර්ෂණ රාජකරුණා මැතිතුමා
25. ගරු රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය
26. ගරු චමින්ද විජේසිරි මැතිතුමා
27. ගරු වරුණ ලියනගේ මැතිතුමා
28. ගරු කිංස් නෙල්සන් මැතිතුමා
29. ගරු රෝහණ බණ්ඩාර මැතිතුමා
30. ගරු එච්.එම්.ධර්මසේන මැතිතුමා
31. ගරු නයන වාසලතිලක මැතිතුමා
32. ගරු බාසූරියගේ ආරියවංශ මැතිතුමා
33. ගරු චමින්ද්‍රානි කිරිඇල්ල මැතිනිය
34. ගරු චතුර ගලප්පත්ති මැතිතුමා
35. ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මැතිතුමා
36. ගරු අමිල ප්‍රසාද් මැතිතුමා
37. ගරු සුරංග රත්නායක මැතිතුමා
38. ගරු ජගත් විතාන මැතිතුමා
39. ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මැතිතුමා
40. ගරු මොහමඩ් නිසාම් කාරියප්පර් මැතිතුමා

3.5.2. ඉලෙන්ගෙයි තමිල් අරුසකච්චි පක්ෂය (08)

